[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/fy;tp mikr;R - gpupntdhf;fs; fy;tpg; gpupT

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

| 01 | S | I |
|---|---|---|

පැය තුනයි

## 03 ශ්‍රේණිය

## (01) සිංහල

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

* **I කොටසේ සහ II කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසේ ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.**

## I කොටස

(1) (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ස්වර අකුරු හඳුන්වන වෙනත් නමක් ලියන්න.

ii. **"එ, ඒ, ඓ"** යන අක්ෂර උත්පත්ති ස්ථාන නම් කරන්න.

iii. **'කර්‍යාලය / කාර්යාලය'** මෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා ලියන්න.

iv. **'ගිනි+කම්'** යන විසන්ධි පදය සන්ධි කර සන්ධි නාමය ලියන්න.

v. **'හෙරණසික කියති හෙරණෝ තැනින් තැන'** මෙහි ඇති සමාස පදය උපුටා, එය කවර සමාසයකට අයත් දැයි ලියන්න.

vi. **'රනින් කරන ලද'** යන අරුත දෙන තද්ධිත පදය ලියන්න.

vii. **'සැලෙන පහන් සිළු වැනි රඟන ලිය සැදී'** මෙම පද්‍ය පාඨයේ ඇති කෘදන්ත පදයක් උපුටා ලියන්න.

viii. **'වපුරයි'** යන ක්‍රියා පදයේ ධාතු ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

ix **'මම අකුරු උගනිති'යි ගුරුවරයා සිතයි'** මෙම වාක්‍යය සදොස් තැන් නිවැරදි කර ලියන්න.

x. **'පරිවෙණාධිපති හිමියෝ ශිෂ්‍යයන් අමතති'** මෙම වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

**(ලකුණු 1×10=10)**

(2) පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් තෝරා ගෙන වචන **150කට නොඅඩු** රචනයක් ලියන්න.

i. අවුකන බුදු පිළිමය .
ii. පොදු දේපළ සුරකිමු .
iii. සුන්දර උදෑසනක අසිරිය .
iv. මා කියවූ රසවත් ම පොත .
v. නූතන තාක්ෂණ මෙවලම් යහපත උදෙසා.

**(ලකුණු 20)**

[ 2 වැනි පිටුව බලන්න]

## II කොටස

(3) (අ) පහත සඳහන් ඡේදය **වචන 20 -25 අතර වන** සේ සාරාංශ කර ලියන්න. සාරාංශය අවසානයේ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

වස් විසීමට කාලය පැමිණියෙන් මිහිඳු මහරහතන් වහන්සේ අනුරාධපුරයෙන් නික්ම චේතියගිරියට වැඩම කළහ. වස් වසන දිනයෙහි රජුගේ බෑනණු වූ මහා අරිට්ඨ ඇමතියා ඇතුළු පනස් දෙනෙක් පැවිද්ද ලබා ගත්හ. මේ අනුව මිහින්තලයේ වස් විසීම සඳහා භික්ෂූන් වහන්සේලා සැට දෙනමක් සිටියහ. ඒ වන විට චේතියගිරියෙහි වාසස්ථාන නොතිබිණි. එබැවින් දෙවනපෑතිස් රජතුමා වර්තමාන කණ්ඨක චේතිය අවට පිහිටි ගල්ලෙන් ශුද්ධ පවිත්‍ර කරවා උන්වහන්සේලාට ආවාස පහසුකම් සලසා දුන්නේ ය.

**(ලකුණු 10)**

(ආ) මාස්මුල්ල, පැතුම්ගම ශ්‍රී ධර්මාලෝක මූලික පිරිවෙණේ ගරු පරිවේණාධිපති සූරියවැවේ ගුණානන්ද හිමි ඔබ යැයි සිතන්න. පිරිවෙණේ ගිහිපැවිදි සිසුන් සමග කොළඹ 07, ස්ටැන්ලි තිලකරත්න මාවතේ පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීමට ඔබ අදහස් කරයි. ඒ සඳහා දිනය සහ වේලාව වෙන් කර ගැනීමට ග්‍රහලෝකාගාරයේ අධ්‍යක්ෂතුමාට ලියන ලිපිය සකස් කරන්න. (ලකුණු 10)

(4) (අ) **'දොර'** ශබ්දය සියලු විභක්තිවල ඒක වචනයේ හා බහු වචනයේ වරනඟන්න. (ලකුණු 10)

(ආ) තද කළු අකුරින් මුද්‍රිත වචන කවර ක්‍රියා වර්ගයකට අයත් දැ යි ලියන්න.

i. වැසි **වසිත** සොරු පලා යති.
ii. මල **පර වී** බිමට වැටෙයි.
iii. සියලු සත්ත්වයෝ සුවපත් **වෙත්වා.**
iv. මෙහෙකාරිය දරුවා **හඬවයි.**
v. උපාසකයා නිවන්සුව **ලබනුව** දහමේ හැසිරේ.

**(ලකුණු 10)**

## III කොටස

(5) (අ) බුදුගුණ අලංකාරයේ එන **'නොමකා කුල සිරිත්'** යන කවිය සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

**(ලකුණු 05)**

(ආ) බුදුගුණ අලංකාර කතුවරයා තමා ඉදිරිපත් කරන කරුණු මැනවින් පැහැදිලි කිරීමට උපමා රූපක භාවිත කර ඇති අයුරු උදාහාරණ සහිතව පැහැදිලි කරන්න .

**(ලකුණු 10)**

(6) (අ) උම්මග්ග ජාතකයේ 'පුත්‍ර ප්‍රශ්නයෙහි ' කතා පුවත වත්මන් බසින් ලියන්න. **(ලකුණු 05)**

(ආ) මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව ඉස්මතු කර දැක්වීමට ජාතක කතාකරුවා ගත් උත්සාහය උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස ඇසුරින් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

(7) (අ) වනකතා පොතේ (මිතුරන්ගේ අගේ) එන **'පුදුම තල වෙළෙදාම'** කතාව සැකෙවින් ලියන්න.

**(ලකුණු 05)**

(ආ) යහපත් සමාජයක් නිර්මාණය කිරීමට ගත හැකි ආදර්ශ රැසක් වනකතා පොතේ ( මිතුරන්ගේ අගේ ) අන්තර්ගත වේ. මේ කියමන සුදුසු නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න . **(ලකුණු 10)**

* * *